# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාවිච්චියෙන් පසු අයෝග්‍ය කරන ලද පහත සඳහන් රථ වාහන/පොදුභාණ්ඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායන්හි දි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් විකිණීමට ඉදිරිපත් කෙරේ.**

| ඒකකය | වාහන | පොදුභාණ්ඩ |
|---|---|---|
| 1 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | ප්‍රයිම්මුවර්, ට්‍රක් රථ, බස්, ඩබල් /සිංගල් කැබ්, කාර්, ගිලන් රථ, වෑන්, ජිප්, ත්‍රි රෝද රථ, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි, මොබයිල් ඩෙන්ටල් ට්‍රේලර් | යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් (භාවිතා කරන ලද හා භාවිතා නොකරන ලද), හිස් බැරල්, අබලි යකඩ, ප්ලාස්ටික් විවිධ, කවර්ස් අවුටර්ස් විවිධ |
| 2 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා ජනපදය රණසේවාපුර, අනුරාධපුර | ට්‍රක්, සිංගල් /ඩබල් කැබ්, ජිප්, ගිලන් රථ, ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් ටේලර්, අත් ට්‍රැක්ටර්, අත්ට්‍රැක්ටර් ටේලර්, වතුර බවුසර්, ධාවන පැදි | ඇළුමිණියම්, සුන්බුන් යකඩ, විදුලි උපකරණ, ප්ලාස්ටික් විවිධ, පයිබර් බෝට්ටු, හිස් බැරල්, ඉටි උර, ප්ලාස්ටික් කෑන්, කවර්ස් අවුටර්ස් |
| 3 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා කඳවුර මහසෙන්පුර, මින්නේරිය | ට්‍රක්, බස්, වතුර බවුසර්, ජිප්, සින්ගල් /ඩබල් කැබ්, ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි | සුන්බුන් යකඩ, ප්ලාස්ටික් කෑන්, කවර්ස් අවුටර්ස් විවිධ භාවිතා කරන ලද විදුලි උපකරණ |
| 5 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා කඳවුර කන්කසන්තුරය | ට්‍රක්, බස්, සින්ගල් /ඩබල් කැබ්, ජිප්, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, වතුර බවුසර්, ට්‍රැක්ටර් ටේලර්, අත්ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි | ෆයිබර් බෝට්ටු, භාවිතා කරන ලද කවර්ස් අවුටර් (ට්‍රැක්ටර්, බර වාහන, සැහැල්ලු වාහන, යතුරු පැදි සහ වෙනත්), |
| 6 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා කඳවුර කොකාවිල්, කිලිනොච්චි | ට්‍රක්, සින්ගල් කැබ්, වතුර බවුසර් ටේලර්, | බැටරි විවිධ, භාවිතා කරන ලද විදුලි උපකරණ, දැව භාණ්ඩ, ටියුබ් ඉනර්, කවර් අවුටර්ස්, ඇළුමිණියම්, හිස් කෑන්, ප්ලාස්ටික් විවිධ, සුන්බුන් යකඩ, යාන්ත්‍රික ප්‍රවාහන අමතර කොටස් (භාවිතා කරන ලද), |
| 7 රෙජි ශ්‍රිලයුයුබ යුද්ධ හමුදා කඳවුර මුලතිව් | ට්‍රක්, ජිප්, සින්ගල් /ඩබල් කැබ්, ට්‍රැක්ටර්, ධාවන පැදි | කවර්ස් අවුටර්ස්, ප්ලාස්ටික් කෑන්, පොලිසැක් උර, බැරල් විවිධ |

**ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ විස්තර හා අදාල ප්‍රසම්පාදන කොන්දේසි**

1. **ප්‍රසම්පාදන කාලසටහන** (සති අන්ත දින හා රජයේ නිවාඩු දින හැර)

| ස්ථානය | රථ වාහන/පොදු භාණ්ඩ ලොට් අංක | පරීක්‍ෂා කල හැකි / අයදුම්පත් ලබාගත හැකි කාලසීමාව | අයදුම්පත් ඉදිරිපත් කල හැකි කාලසීමාව | ප්‍රසම්පාදනය විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | 01 සිට 120 දක්වා (වාහන)<br>01 සිට 06 දක්වා (පොදු භාණ්ඩ) | 2017.06.19 දින 0830 පැයේ සිට 2017.06.28 දින 1600 පැය දක්වා | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.03 දින 1000 පැය දක්වා | 2017.07.03 දින 1030 පැයට |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | 01 සිට 56 දක්වා (වාහන)<br>01 සිට 10 දක්වා (පොදු භාණ්ඩ) | | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.06 දින 1000 පැය දක්වා | 2017.07.06 දින 1030 පැයට |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 01 සිට 16 දක්වා (වාහන)<br>01 සිට 10 දක්වා (පොදු භාණ්ඩ) | | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.07 දින 1000 පැය දක්වා | 2017.07.07 දින 1030 පැයට |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 01 සිට 31 දක්වා (වාහන)<br>01 සිට 03 දක්වා (පොදු භාණ්ඩ) | | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.11 දින 1000 පැය දක්වා | 2017.07.11 දින 1030 පැයට |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි | 01 සිට 08 දක්වා (වාහන)<br>01 සිට 10 දක්වා (පොදු භාණ්ඩ) | | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.12 දින 1000 පැය දක්වා | 2017.07.12 දින 1030 පැයට |
| 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මුලතිව් | 01 සිට 11 දක්වා (වාහන)<br>01 සිට 06 දක්වා (පොදු භාණ්ඩ) | | 2017.06.19 දින 0900 පැයේ සිට 2017.07.13 දින 1000 පැය දක්වා | 2017.07.13 දින 1030 පැයට |

2. **ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අසාදු ලේඛණ ගතකර ඇති අයවළුන් හට ඉදිරිපත් විය නොහැක.**

3. ප්‍රසම්පාදන අයදුම්පත් අදාල වාහන/පොදුභාණ්ඩ එක්රැස්කර ඇති භූමියේ ස්ථාපිතකර ඇති කාර්යාලයෙන් මිලදිගත හැක. ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගැනිම සඳහා **එක් ලොට් එකක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු: 500/= (රුපියල් පන්සියක) මුදලක්** අය කරන අතර එම මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අවශ්‍ය ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගත හැක. වාහන/පොදුභාණ්ඩ සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගත යුතුවන අතර, ඒ ඒ ප්‍රසම්පාදන අයදුම්පත් මගින් දක්වා ඇති වාහන/පොදුභාණ්ඩ සඳහා පමණක් මිලගණන් ඉදිරිපත් කල යුතුය. (උදා: වාහන අයදුම්පතක් මගින් පොදුභාණ්ඩ සඳහා මිලගණන් ඉදිරිපත් කල නොහැක. **එක් ගැණුම්කරුවෙකු ලොට් කිහිපයකට මිලගණන් ඉදිරිපත් කරන්නේනම් ඒ සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන අයදුම්පත් රු: 500/= බැගින් ගෙවා මිලදී ගත යුතුය. එක් ප්‍රසම්පාදන අයදුම්පතකින් ඉදිරිපත් කල හැක්කේ එක් ලොට් එකකට අදාල මිලගණන් පමණකි එසේ නොමැති ප්‍රසම්පාදන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

4. **වාහන සහ පොදුභාණ්ඩ සඳහා අදාල වන ඇප තැන්පතු (ආපසු ගෙවනු ලබන) ප්‍රමානයන් ඇතුලත් වගුවක් වාහන/පොදුභාණ්ඩ අයදුම්පතෙහි ඇතුලත්වේ. ඒ අනුව සෑම වාහන/පොදුභාණ්ඩ ලොට් එකක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඇප තැන්පතු** ඉදිරිපත් කල යුතු අතර එම ඇප මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු **ලැබෙන කුවිතාන්සිය (මුල් පිටපත) අනිවාර්යයෙන්ම අදාල අයදුම්පත සමග** අමුණා ඉදිරිපත් කල යුතුය. **ඇප කුවිතාන්සිය ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

5 අයදුම්පත් ඉදිරිපත් කිරිමේදි රථ වාහන/පොදුභාණ්ඩ වල සටහන් කර ඇති ලොට් අංකය **අනිවාර්යයෙන්ම අයදුම්පතෙහි හා අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ** පහත සඳහන් අයුරින් සටහන් කල යුතුය.

**ලොට් අංකය:................................ප්‍රසම්පාදනය විවෘත වන දිනය: 2017.......................මස.........................දින වාහන/පොදුභාණ්ඩ වර්ගය**...........................

6. ප්‍රසම්පාදන පෙට්ටි තබා ඇති ස්ථානය හා **අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවන්නේනම් එවිය යුතු ලිපිනය පහත දක්වා ඇත.** රථ වාහන/පොදුභාණ්ඩ සඳහා වෙන වෙනම පෙට්ටි වෙන්කර තබා ඇති අතර එම පෙට්ටි සතියේ වැඩ කරන දිනවල (සති අන්ත හා රජයේ නිවාඩු දිනවල හැර) උදෑසන 0900 පැයේ සිට 1600 පැය දක්වා නියෝජිතයෙකු භාරයේ පහත දක්වා ඇති ස්ථානයන්හි තබා ඇත. **අයදුම්පත් පෙට්ටි වල බහාලිමට ප්‍රථම එම ස්ථානයේ සිටින නියෝජිත භාරයේ තබා ඇති ලේඛණයේ ලේඛණ ගතකර අදාල පෙට්ටියට බහාලිය යුතුය. වාහන අයදුම්පත් වාහන පෙට්ටියටද පොදුභාණ්ඩ අයදුම්පත් පොදුභාණ්ඩ පෙට්ටියටද බහාලිය යුතු අතර, අදාල නොවන පෙට්ටියකට බහාලන ලද අයදුම්පත් ප්‍රතිකෂේපිත අයදුම්පත් සේ සලකනු ලබයි.**

| ස්ථානය | පෙට්ටි තබා ඇති ස්ථානය ප්‍රසම්පාදන | අයදුම්පත් එවිය යුතුතැපැල් ලිපිනය | ප්‍රසම්පාදන විවෘත කරනු ලබන ස්ථානය |
|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | ආරක්‍ෂක සේනා මුලස්ථානය (බටහිර) යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | බෝධිරාජාරාමය<br>යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කදවුර, රණසේවාපුර, අනුරාධපුර | 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කදවුර, රණසේවාපුර, අනුරාධපුර |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායයුද්ධ හමුදා කදවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කදවුර, මහසෙන්පුර, මින්නේරිය |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කදවුර, කන්කසන්තුරය | 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කදවුර, කිලිනොච්චි | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි |
| 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මුලතිව් | 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>ප්‍රධාන දොරටුව අසල | ටෙන්ඩර් මණ්ඩල සභාපති<br>7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කදවුර, මුලතිව් | 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය<br>යුද්ධ හමුදා කඳවුර, මුලතිව් |

7. සෑම අයදුම්පතක්ම නිසි අයුරු සම්පූර්ණ කර කවරයක බහා ඉහත දක්වා ඇති ස්ථානයේ තබා ඇති නිවැරදි පෙට්ටි වලට නියමිත දින හා වේලාවට ප්‍රථම පුද්ගලිකව බහාලිමට හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිමට කටයුතු කල යුතුය. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

8. **අයදුම්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාව සහතික කල හැකි ජාතික හැඳුනුම්පත/ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය සහිතව ගැණුම්කරු** හෝ **ගැණුම්කරු සහභාගි නොවන්නේ නම් ඔහු වෙනුවට බලය පවරන ලද නීත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්‍යයෙන්ම සහභාගි කරවීමට** ක්‍රියා කල යුතුය.

9. අයදුම්පත් විවෘත කිරීමෙන් අනතුරුව **එම අවස්ථාවේදිම එක් එක් ලොට් අංකය වෙනුවෙන් උපරිම මිල ඉදිරිපත් කර ඇති අයදුම්කරු හා මුදල ප්‍රකාශයට පත්කල විගස එම අයදුම්කරු හෝ ඔහු විසින් නිත්‍යාණුකූලව බලය පවරන ලද නියෝජිත විසින් ප්‍රසම්පාදන මුදලින් 25 % ක ප්‍රමාණයක් එම අවස්ථාවේදිම ගෙවිය යුතු අතර 25% ක මුදල ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් අනිවාර්‍යයෙන්ම රැගෙන ආයුතු අතර ඒ සඳහා අමතර කල් ලබාදීමක් සිදු නොකෙරේ.** මේ සඳහා ප්‍රේෂණපත් භාර නොගන්නා අතර ඉතිරි සම්පූර්ණ මුදල එදින හෝ ප්‍රසම්පාදනය පැවති දිනයේ සිට (එදින හැර) වැඩ කරන දින 07 ක් අවසාන වීමට ප්‍රථම (හත් වන දින 1600 පැයට ප්‍රථම) මුදලින් ගෙවිය යුතුය. **ප්‍රසම්පාදනය පවත්වන ලද දින සිට උපරිම ලෙස සතියේ වැඩ කරන දින 07 ක් ඇතුලත සම්පූර්ණ මුදල ගෙවීමෙන් පසු එම හත්වන දින සිට (එම දින හැර) උපරිම ලෙස දින 14 ක් ඇතුලත (සති අන්ත හා රජයේ නිවාඩු දින ඇතුළුව) අදාල වාහන හෝ පොදුභාණ්ඩ කඳවුරු භූමියෙන් ඉවත්කර ගැනීමට ක්‍රියාකල යුතුය.** එම කාලසීමාව ඇතුලත අදාල වාහන හෝ පොදුභාණ්ඩ රැගෙන යනු නොලැබුවහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ඒ සඳහා ගෙවා ඇති සම්පූර්ණ මුදල සහ තැන්පත්කර ඇති ඇප මුදල රාජසන්තක කිරීමේ බලය වත්කම් කලමනාකරණ අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුව ඇත.

10. **යම් ලොට් අංකයක් වෙනුවෙන් උපරිම මිල ඉදිරිපත් කර තිබුණද ඉහත 7 ජේදයේ දක්වා ඇති කොන්දේසි අනුව අයදුම්කරු හෝ නිත්‍යානුකූල නියෝජිතයෙකු අයදුම්පත් විවෘත කරන දින නියමිත වේලාවට හෝ උපරිම වශයෙන් ප්‍රසම්පාදනය විවෘත කරනු ලබන දිනයේ 1300 පැය වන විට ප්‍රසම්පාදනය පවත්වන භූමියට පැමිණ නොසිටිහොත් හෝ** යම් ගැණුම්කරුවෙකු හට ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමෙන් පසු එම වාහන/පොදුභාණ්ඩ මිලදී ගැනීම ලිඛිතව ප්‍රතික්‍ෂේප කරනු ලැබුවහොත් **ප්‍රසම්පාදන පිරිනැමුම අවලංගු වන අතර අයදුම්කරුවන් තැන්පත්කර ඇති ඇප මුදල් එම අවස්ථාවේදිම රාජසන්තක කිරීමට කටයුතු කරනු ඇත.** එවැනි අවස්ථාවකදී ඉදිරිපත්ව තිබූ උපරිම මිල, ඊලඟ උපරිම මිල අතර පරතරය හා තක්සේරු මිල සසඳා බලා එම ලොට් නැවත ප්‍රසම්පාදනයට ඉදිරිපත් කරන්නේද ඊලඟ උපරිම මිල ඉදිරිපත් කර ඇති අයදුම්කරුට එය ප්‍රදානය කරන්නේද නැතහොත් ස්ථිරවම ප්‍රසම්පාදනයෙන් ඉවත් කරන්නේද යන්න පිලිබඳ අවසාන තිරණය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

11. **සැලකිය යුතු කරුණු :**

අ. තිරු බද්දෙන් නිදහස් වාහන මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් අදාල වාහනය නිදහස් කර ගැනීම සඳහා තිරු බදු මුදල් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවට ගෙවීමට කටයුතු කල යුතු අතර තිරු බදු නිදහස්ව ආනයනය කල වාහන පිලිබඳ විස්තර හා තිරු බදු මුදල අදාල ශ්‍රීලයුඛ ඒකක වෙතින් දැණුම් දෙනු ඇත.

ආ. සුන්බුන් වාහන හැර අනෙකුත් වාහන මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් එම වාහන කඳවුරු භූමිය තුලින් ඉවත්කර ගැනීමට ප්‍රථම අදාල කඳවුරේ නියෝජිතයන් විසින් ලබාදෙන ලියකියවිලි සමග වාහනයේ චැසි/එන්ජින් අංක නිවැරදිව ඇති බවට තහවුරුකර ගැනීමෙන් අනතුරුව වාහන ඉවත්කර ගත යුතුය. (කඳවුරු භූමිය තුලින් වාහන ඉවත්කර ගත් පසු ඇතිවන ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වගකියනු නොලැබේ)

12. මෙම ප්‍රසම්පාදනය සැබඳිව ඉහත සඳහන් කොන්දේසි හා අයදුම්පත් වල දක්වා ඇති කොන්දේසි හොඳින් කියවා බලා තේරුම් ගෙන ඒවාට අනුකූලව ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකිරීම අයදුම්කරුවන් සතු වගකීම බව අවධාරණය කරන අතර ප්‍රසම්පාදනය පිලිබඳ අවසාන තිරණය ප්‍රසම්පාදන මණ්ඩල සභාපති සතුවේ. මේ පිලිබඳ වැඩි විස්තර යුද්ධ හමුදා මූලස්ථානයේ දුරකථන අංක: 011 - 3070476 වෙතින් හා යුද්ධ හමුදා වෙබ් අඩවියෙන් (www.army.lk) ලබාගත හැක.

**යුද්ධ හමුදාධිපති**